# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2399/04 - 2024 අගෝස්තු මස 26 වැනි සඳුදා - 2024.08.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ සංශෝධන පනතින් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 8(8) වැනි වගන්තිය අනුව නිකුත් කරන ආචාර ධර්ම පද්ධතිය**

2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ සංශෝධන පනතින් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 8(8) වැනි වගන්තිය අනුව ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කෙරෙන ආචාර ධර්ම පද්ධතිය උපලේඛන 01 හි සඳහන් වේ.

**ආර්. එම්. ඒ. එල්. රත්නායක,**
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

**එම්. ඒ. පී. සී. පෙරේරා,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**අමීර් ෆායිස්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**ඒ. ෂන්මුගනාදන්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2024 අගෝස්තු මස 26 වැනි දින,
සරණ මාවත, රාජගිරිය,
මැතිවරණ කොමිෂන් සභාවේ දී ය.

උපලේඛන 01

## ඡන්ද විමසීමේ දී තරග කරනු ලබන දේශපාලන පක්ෂ/ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයින් විසින් අනුගමනය කළ යුතු ආචාර ධර්ම පද්ධතිය

2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ සංශෝධන පනතින් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 8(8) වැනි වගන්තිය අනුව නිකුත් කෙරෙන මෙම ආචාර ධර්ම පද්ධතිය ඕනෑම ඡන්ද විමසීමකට අදාළ නාමයෝජනා දැන්වීම පළ කරනු ලබන දින සිට ඡන්ද විමසීමේ ප්‍රතිඵල ප්‍රකාශ කිරීම දක්වා කාලයට අදාළ වේ.

මැතිවරණ නීතියට අනුව දේශපාලන පක්ෂ පිළිගැනීමට ප්‍රථම මෙරට ජනතාව තුළ සමාජගත වූ දේශපාලන පක්ෂ තිබූ අතර, ඒ පිළිබඳ ඉතිහාසය 1931 වර්ෂය දක්වා ඈතට දිවයයි. දේශපාලන පක්ෂ පිළිගැනීම පිළිබඳ නීති 1959 සිට විවිධ අවස්ථාවල සංශෝධනය වී ඇත. වත්මන් සමාජ ප්‍රගමනය වෙනුවෙන් දේශපාලන පක්ෂ විසින් සිදු කරනු ලබන මෙහෙය, වඩාත් අර්ථවත් හා ඵලදායී වීමට නීති රීති මාර්ගයෙන් කළ හැකි දේ සීමාසහිත බැවින් නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට අවශ්‍ය යහපත් වාතාවරණය පවත්වා ගැනීමේ වැඩි වගකීම දේශපාලන පක්ෂ වෙත පැවරේ.

එම වගකීම ද සැලකිල්ලට ගෙන 2012 වර්ෂයේ පැවැත්වූ පළාත් සභා ඡන්ද විමසීම අරමුණු කරගෙන ප්‍රථම වරට මෙම ආචාර ධර්ම පද්ධතිය එවකට පැවති මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් දේශපාලන පක්ෂ හා අපේක්ෂකයින් සඳහා ප්‍රකාශයට පත් කරන ලදී. තව ද, 2012 වර්ෂයේ සිට පැවැත් වූ සියලුම ඡන්ද විමසීම්වලට අදාළව පවත්වනු ලැබූ මැතිවරණ පැමිණිලි විමර්ශන සඳහා වූ කමිටු රැස්වීම්වල දී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදුව දේශපාලන පක්ෂ ලේකම්වරුන්, පක්ෂ නියෝජිතයන් සහ නිරීක්ෂණ කණ්ඩායම් නියෝජිතයන්ගේ එකඟතාව ද මෙම ආචාර ධර්මවලට හිමිව තිබේ.

මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන මෙම සංශෝධිත ආචාර ධර්ම පද්ධතිය සියලු මැතිවරණවලට තරග කරන අපේක්ෂකයින්, දේශපාලන පක්ෂවල නායකයන්, ලේකම්වරුන් ඇතුළු සියලුම ප්‍රමුඛ තනතුරුධාරීන්ට හා සියලුම දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන්ට මෙන්ම අපේක්ෂකයන්ගේ ආධාරකරුවන්ට ද ස්වාධීන කණ්ඩායම් නායකයින්ට හා එම අපේක්ෂකයින්ට ද ආධාරකරුවන්ට ද අදාළ වන බව සැලකිය යුතු වේ.

එබැවින් මෙහි සඳහන් ආචාරධර්මවලට අනුකූලව ක්‍රියා කරන ලෙස මැතිවරණවලට සම්බන්ධවන ඉහතින් සඳහන් කළ සියලුම තැනැත්තන් වෙත කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

අ. නීතියේ ආධිපත්‍ය

1. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා අනෙකුත් නීතිවලින් සහතික කර ඇති පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂාවන පරිදි මැතිවරණ නීතිවලට අනුකූලව මහජන නියෝජිතයින් තෝරා ගැනීමට අදාළව පවත්වනු ලබන ඡන්ද විමසීම්වල දී හෝ ජනමත විචාරණයක දී ඡන්දදායකයාට නිදහසේ සහ කිසිදු බලපෑමකින් තොරව සිය ඡන්දය ප්‍රකාශ කිරීමට අවකාශය සැලසීම හා ඊට අවශ්‍ය ආධාර හා අනුබල ලබා දීම.

2. ඡන්ද විමසීමක් වෙනුවෙන් ඉදිරිපත් වන සියලුම දේශපාලන පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයන්ට මැතිවරණ ක්‍රියාවලියේ දී හිමිවන සම අයිතිවාසිකම් සෑම පියවරකදීම ආරක්ෂා කිරීම.

3. සියලුම දේශපාලන පක්ෂවලට, අපේක්ෂකයින්ට හා ස්වාධීන කණ්ඩායම්වලට හිමිවන අයිතිවාසිකම් හා ඡන්දදායකයින් දැනුම්වත් කිරීමට ඇති අයිතියට ගරු කරමින් විරුද්ධ මතධාරීන්ට ඔවුන්ගේ මතය දැරීමට හා ඒ වෙනුවෙන් නීත්‍යානුකූලව ප්‍රචාරක කටයුතු/ප්‍රවර්ධන කටයුතු සිදු කිරීමට ඇති අයිතියට බාධා නොකිරීම.

4. ශ්‍රී ලංකාවේ බලපවත්නා නීතිවලට අනුකූලව පිහිටුවා ඇති රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික හෝ වෙනත් ආයතනවලට නීතියෙන් අපේක්ෂා කර ඇති නැතහොත් නියමකර ඇති ආකාරයට කටයුතු පවත්වාගෙන යාමට කිසිදු ආකාරයකින් බාධා හෝ බලපෑම් නොකිරීම.

5. රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම පැවරී ඇති ආයතනවලට හා එම කටයුතු පැවරී ඇති අයට අදාළ රාජකාරී ඉටුකිරීමේ දී බාධා හෝ බලපෑම් නොකිරීම.

6. සාමාන්‍ය ජන ජීවිතයට බාධා නොවන අයුරින් සහ පවත්නා නීති රීති උල්ලංඝනය නොවන අයුරින් ඡන්ද විමසීම් ප්‍රචාරක කටයුතු සිදු කිරීම පිළිබඳව සහතික කිරීම.

මැතිවරණ කොමිෂන් සභාව පිළිගත් දේශපාලන පක්ෂ (*සම්බන්ධිතයි*)

7. සෑම ඡන්ද විමසීමකට ම අදාළ පනත්වල දැක්වෙන නීති රීති (වගන්ති) ගැන සියලු අපේක්ෂකයින්ට හා ප්‍රමුඛ ක්‍රියාකාරීන්ට අවබෝධයක් ලබා දීම සහ එම පනත්වල දැක්වෙන වැරදි, දූෂණ ක්‍රියා සහ නීතිවිරෝධී ක්‍රියාවලින් වළකින ලෙස උපදෙස් දීම.

8. ඡන්ද විමසීමට හෝ ඡන්ද ගණන් කිරීමට හේතු පාදක වන ද්‍රව්‍ය, උපකරණ, ලිපි ලේඛන නිසි බලධරයෙකුගේ අවසරයකින් තොරව ස්පර්ශ කිරීම හෝ ගබඩා කර ඇති ස්ථානයෙන් ඉවතට ගෙන යාමෙන් වැළකීම.

9. මැතිවරණ නීති උල්ලංඝනය කිරීම, මැතිවරණ කටයුතුවලට බාධා කිරීම, මැතිවරණ දූෂණ හා වැරදි සිදු කිරීම සම්බන්ධව නීති ක්‍රියාත්මක කරන අංශ විසින් සිදුකරන පරීක්ෂණවලට බාධා නොකිරීම හා එම අංශවලට ස්වාධීනව ක්‍රියා කිරීමට අවශ්‍ය පසුබිම සැලසීම.

ආ. සාමාන්‍ය හැසිරීම

01. ශ්‍රී ලාංකිකයින් අදහන ආගම්, භාවිතා කරන භාෂාව, ඔවුන්ගේ වාර්ගිකත්වය, චාරිත්‍ර වාරිත්‍ර හා කුලගෝත්‍ර ආදී වෙනස්කම් සම්බන්ධයෙන් යම් ජන කොට්ඨාසයක හෝ යම් පුද්ගලයින් පිරිසකගේ හෝ වෛරය හෝ නොඉවසනසුලු බව උග්‍රවන ආකාරයට හෝ හැසිරීමෙන් වැළකීම සහ එවැනි හැඟීම් ඇතිවන අයුරින් අදහස් හෝ කරුණු ප්‍රකාශ නොකිරීම.

02. දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් සම්බන්ධයෙන් සිදුකරන විවේචන, ඒ ඒ පක්ෂයේ ප්‍රතිපත්තිවලට, වැඩසටහන්වලට හා අතීත ක්‍රියාකාරකම්වලට සීමා කළ යුතු අතර විරුද්ධවාදී මෙන්ම ස්වකීය පාක්ෂිකයන්ගේ හෝ අපේක්ෂකයන්ගේ පොදු කටයුතුවලට සම්බන්ධයක් නොමැති ඔවුන්ගේ පෞද්ගලික කටයුතු විවේචනය කිරීමෙන් වැළකීම හා සනාථ කර නොගත් චෝදනා, සනාථ කළ නොහැකි කරුණු සහ විකෘති කළ අදහස් මත විවේචනය සිදු නොකිරීමට වග බලා ගැනීම.

03. තෝරා පත්කර ගැනීම මඟින් පිහිටුවීමට අපේක්ෂා කරනු ලබන ව්‍යවස්ථාපිත ආයතනයේ අරමුණු ඉටුකරලීම මඟින් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ අනාගත අභිවෘද්ධිය සාක්ෂාත් කරලීමට ඇපකැප විය හැකි අපේක්ෂකයින් තරගයට ඉදිරිපත් කොට ඔවුන් ඡන්ද ව්‍යාපාරයේ දී විනයක් හා හික්මීමක් ඇතිව මෙහෙය වීම.

04. දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් නායකයින් විසින් අපේක්ෂකයන් තරගය සඳහා තෝරා ගැනීමේ දී ඔවුන්ගේ පූර්ව කල්ක්‍රියාවල යහපත්භාවය, නීතියට ගරු කරමින් ක්‍රියා කිරීම, නීතිය ඉදිරියේ දී වරදකරුවන්ව නොසිටීම, මහජන සේවයට කැපවී සිටීම, ධනබලය හෝ සාමාජයීය බලය නිසා ජන සමාජය පීඩාවට පත් නොකිරීම යනාදී ගුණාංග කෙරෙහි අවධානය යොමුකර කටයුතු කිරීම.

05. නාමයෝජනා භාරදෙන විට හෝ ඉන්පසු දින 30 ක් ඉකුත් වීමට පෙර සියලුම අපේක්ෂකයින් විසින් එවුන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ තේරීම් භාර නිලධාරීට භාරදීම.

06. ඡන්ද පොළ පරිශ්‍රය තුළ හෝ ඡන්ද ගණන් කිරීමේ ශාලා පරිශ්‍රය තුළ දුම්බීම හෝ එම ස්ථානවලට මත්ද්‍රව්‍ය පාවිච්චි කර පැමිණීමෙන් වැළකී සිටිය යුතු බවට අපේක්ෂකයින්/නියෝජිතයින් දැනුම්වත් කිරීම.

07. නාමයෝජනා භාර ගන්නා ස්ථානයට හෝ ඡන්ද මධ්‍යස්ථානවලට මෙන්ම එහි පරිශ්‍රයට හෝ ඡන්ද ගණන් කරනු ලබන ස්ථානවලට හෝ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමේ ස්ථානවලට අවසර ඇති පුද්ගලයින් පමණක් ඇතුල්වීම හා එම ස්ථානවලට අවි ආයුධ රැගෙන නොආයුතු බවට වූ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම.

08. ඡන්ද විමසීමට අදාළ තහනම් ක්‍රියාවලිය යෙදීම හෝ තම ආධාරකරුවන් එම ක්‍රියාවන්ට පෙළඹවීම හෝ ඊට අනුබල දීම යන කටයුතුවල නොයෙදීම.

09. ඡන්ද විමසීම් කාලසීමාව තුළ දී පවත්වනු ලබන රාජ්‍ය උත්සවවල දී අපේක්ෂකයන් හෝ දේශපාලන පක්ෂවල ප්‍රමුඛ ක්‍රියාකාරීන් හෝ සහභාගී නොවීම හා එවැනි උත්සව පක්ෂ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා භාවිතා නොකිරීම.

ඇ. මැතිවරණ ප්‍රචාරණ කටයුතු

1. ඡන්ද විමසීම නීතියේ දැක්වෙන ආකාරයට මැතිවරණ ප්‍රචාරණ කටයුතු නීත්‍යානුකූලව ද නීතිය හා සාමය රැකෙන පරිදි ද සිදු කිරීම, විරුද්ධ පාර්ශ්වකරුවන්ගේ නීත්‍යානුකූල මැතිවරණ කටයුතුවලට බාධා නොකිරීම හා නීත්‍යානුකූල අන්දමින් ඡන්ද ප්‍රචාරණ කාර්යාල පවත්වාගෙන යාම.

2. ඡන්ද විමසීමේ දී තරග කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂ තමන්ගේ පක්ෂයේ ප්‍රතිපත්ති මාලාව හා යම් කාල සීමාවක් තුළ තම පක්ෂය විසින් ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වැඩපිළිවෙලක් ඡන්දදායකයන් වෙත ඉදිරිපත් කිරීම හා එහි පිටපත් මැතිවරණ කොමිෂන් සභාව වෙත හා එමඟින් ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත යැවීම.

3. මුද්‍රිත ලේඛන හෝ අත් පත්‍රිකා මඟින් ඡන්දදායකයින් දැනුවත් කිරීම සඳහා වූ ලේඛන මුද්‍රණය කිරීම හා බෙදා හැරීම සම්බන්ධයෙන් මැතිවරණ නීතිය අනුව ක්‍රියා කිරීම.

   i. මුද්‍රණකරුගේ/ ප්‍රකාශකගේ තොරතුරු නොමැති අත් පත්‍රිකා බෙදා හැරීම, නීති විරෝධී දැන්වීම් මුද්‍රණය කරවීම යනාදී කරුණුවලින් වැළකී සිටීම.

   ii. අත් පත්‍රිකා බෙදීමේ කාර්යයන් සඳහා හෝ ඡන්ද ආයාචනා කිරීම සඳහා ගෘහයෙන් ගෘහයට යාමේ දී පෙරහැර, පෙළපාලි සේ විශාල ජන සමූහ හෝ සංගීත වාදන, ප්‍රදර්ශන පුවරු යොදා නොගැනීම හා නීතියෙන් තහනම් කර ඇත්නම් අපේක්ෂකයින් හා සමීපතම ඥාතීන් ඡන්ද ආයාචනය සඳහා ගෘහයෙන් ගෘහයට යාමෙන් වැළකී සිටීම.

4. ඡන්ද විමසීම් කාලසීමාවේ දී දේශපාලන පුවත්, ලිපි, දැන්වීම් හෝ අතිරේක යනාදිය රජයේ හෝ රාජ්‍ය ආයතනවල වියදමින් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් පළ නොකිරීම.

5. තම පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයන්ගේ හෝ ජයග්‍රහණය පතා හෝ වෙනත් පාර්ශ්වයක් පරාජය අපේක්ෂාවෙන් මැතිවරණ ප්‍රචාරණ දැන්වීම්, ප්‍රචාරක පුවරු එයට අදාළ ඡායාරූප, චිත්‍ර යනාදිය අවසරලත් නිවේදිත කාර්යාලවල හෝ ප්‍රචාරක රැස්වීම් පැවැත්වෙන දින රැස්වීම් භූමියේ හෝ/හැර මහජනයාට ප්‍රදර්ශනය වන පරිදි රාජ්‍ය හෝ පෞද්ගලික ගොඩනැගිල්ලක, වාසස්ථානයක, හිස් භූමියක හෝ මහජනයාට ප්‍රවේශවීමට අවසර ඇති මාර්ගවල හෝ පොදු ස්ථානවල නීති විරෝධී ලෙස ප්‍රදර්ශනය කිරීමෙන් වැළකීම.

6. විධිමත් පරිදි නිසි අවසරය ලබා අවසර ලබා ගැනීමෙන් පමණක් නිවේදිත ඡන්දකාර්යාල ආරම්භ කළ යුතු අතර කාර්යාල සඳහා අවසර දෙනු ලබන පක්ෂ/කණ්ඩායම්/අපේක්ෂකයන් ප්‍රචාරක කටයුතු හැර වෙනත් කිසිදු පක්ෂ අපේක්ෂකයකුගේ ප්‍රචාරක කටයුතු නොකළ යුතුය.

7. පක්ෂ/කණ්ඩායම් අපේක්ෂක භේදයකින් තොරව සාමාන්‍ය තත්ත්ව යටතේ දී කුලී පදනම මත ලබා දෙන රැස්වීම් ශාලා හෝ ක්‍රීඩා භූමි යනාදිය හෝ හැර රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනවලට හෝ අයත් භූමි, ගොඩනැගිලි හෝ දේපළක් හෝ සේවාවක් හෝ රජයේ නිලධාරීන් මැතිවරණ ප්‍රචාරණ/ ප්‍රවර්ධන කටයුතු සඳහා භාවිතා කිරීමෙන් වැළකී සිටීම සහ රජයේ කාර්යාල, පාඨශාලා ආදී කිසිදු ආයතනයක් තුළ හෝ එම පරිශ්‍ර තුළ ඡන්ද ආයාචනා කිරීම, අත් පත්‍රිකා බෙදීම, ප්‍රදර්ශන පුවරු හෝ දැන්වීම් ප්‍රදර්ශනය කරවීම යනාදී ප්‍රචාරක කටයුතු නොකිරීම.

8. දේශපාලනඥයන් සඳහා වෙන්කර දී ඇති රජයේ නිල නිවාස, හා නිල කාර්යාල පක්ෂ හෝ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා ඡන්ද කාර්යාල ලෙස භාවිතා නොකළ යුතු ය. එමෙන්ම එවැනි නිල නිවාස හා නිල කාර්යාල තුළ ඡන්ද විමසීම් නීතිරීතිවලට හෝ කොමිෂන් සභාව විසින් ගැසට් මඟින් නිවේදනය කරනු ලැබ ඇති විධානවලට පටහැනි කිසිදු වරදක් හෝ දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් හෝ සිදු නොකළ යුත්තේ ය.

9. මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් පොදු ගොඩනැගිලි, ක්‍රීඩාභූමි, රජයේ සංචාරක නිවාස යොදා ගන්නේ නම්, නියමිත ගෙවීම් සිදුකොට ඒවා භාවිතා කිරීම හා එවැනි අවස්ථා එම ආකාරයටම සියලුම අවශ්‍ය පාර්ශ්වවලට ලබා ගැනීමට හැකිවන පරිදි ක්‍රියා කිරීම.

10. පළාත් පාලන ආයතන සතු ක්‍රීඩා භූමි හෝ ශාලා පහසුකම් වෙන්කරවා ගැනීමේ දී ඇතිවන ගැටලු අවම කර ගැනීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ඒ ඒ තේරීම්භාර නිලධාරී විසින් පවත්වනු ලබන දිස්ත්‍රික් කමිටුවේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට සියලුම දේශපාලනඥයින් කටයුතු කළ යුතු ය.

11. ඡන්ද විමසීම් පැවැත්වෙන ප්‍රදේශයක රජය විසින් හෝ රජයේ අනුග්‍රහයෙන් සැණකෙළි, සංදර්ශන හෝ ප්‍රදර්ශන හෝ ක්‍රීඩා තරග ආදිය පවත්වන්නේ නම් එම අවස්ථා ඡන්ද විමසීම් සඳහා ඉදිරිපත්ව සිටින අපේක්ෂකයින්ගේ හා පක්ෂවල ජයග්‍රහණය පිණිස දේශපාලන ප්‍රචාරණ කටයුතුවලට සම්බන්ධ කර ගැනීමට ක්‍රියා නොකිරීම.

12. දේශපාලන අයිතිවාසිකම් අහිමි රාජ්‍ය නිලධාරීන්ගේ හා සක්‍රිය සේවයේ යෙදී සිටින ආරක්ෂක හමුදා හා පොලිස් නිලධාරින්ගේ මෙන්ම විශ්‍රාමික ආරක්ෂක හමුදා නිලධාරීන් හෝ පොලිස් නිලධාරීන් සේවයේ සිටිය දී ලබා ගන්නා හෝ නිල ඇඳුමෙන් සැරසී ලබා ගන්නා ඡායාරූප හෝ ප්‍රකාශ, පක්ෂ/කණ්ඩායම් අපේක්ෂක ප්‍රවර්ධනය වන ආකාරයට හෝ අගතියට පත්වන ආකාරයට විද්‍යුත්, මුද්‍රිත, සමාජ මාධ්‍ය හෝ වෙනත් ප්‍රචාරක මාධ්‍යයක් හෝ තුළින් ප්‍රකාශ කිරීම, විකාශය කිරීම හෝ ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා භාවිතා කිරීම නොකළ යුතු ය.

13. මහජන නියෝජිතයින්ගේ නීත්‍යානුකූල රැකවලුන් වශයෙන් කටයුතු කරනු ලබන පොලීසියේ හා අනෙකුත් ආරක්ෂක අංශවල නිලධාරීන් නිල නොවන ආකාරයට දේශපාලන මැතිවරණ ප්‍රචාරණ කටයුතුවලට යොදා ගැනීම හා විරුද්ධ පාක්ෂිකයින්ගේ මැතිවරණ කටයුතු මැඩලීමට යොදවා ගැනීමෙන් වැළකීම, එවැනි කාර්යයන් ප්‍රසිද්ධියේ හෙළා දැකීම.

14. මහජන නියෝජිතයෙකුගේ ආරක්ෂාව වෙනුවෙන් නීත්‍යානුකූලව භාවිතයට දී ඇති ගිනි අවි හා අනෙකුත් ආරක්ෂිත උපකරණ හා මෙවලම් අපේක්ෂිත මහජන නියෝජිතයාගේ ආරක්ෂාව වෙනුවෙන් හැර කිසිදු නීත්‍යානුකූල නොවන අන්දමේ කටයුත්තකට යොදවා ගැනීමෙන් වැළකී සිටීම.

15. මැතිවරණ ප්‍රචාරණ/ ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් කිසිදු ආගමික ස්ථානයක් හෝ ආගමික ස්ථානයකට අයත් භූමියක් හෝ දේපළක් භාවිතා කිරීමෙන් වැළකී සිටීම.

16. දේශපාලන පක්ෂවල ස්වාධීන කණ්ඩායම්වල ප්‍රචාරණ කටයුතු සඳහා සාමාන්‍යයෙන් මුදල් අයකර ලබාදෙන රජයේ ස්ථාන එක් පක්ෂයක හෝ අපේක්ෂකයකුගේ ප්‍රචාරණ කටයුතු සඳහා පමණක් දීර්ඝ කාලයකට වෙන්කර ගැනීමට ක්‍රියා නොකළ යුතු අතර වෙනත් පක්ෂ/කණ්ඩායම් අපේක්ෂක ප්‍රචාරණ කටයුතු සඳහා එවැනි ස්ථාන ලබා ගැනීමට සම අවස්ථා ලබාදිය යුතු ය.

17. ඡන්ද විමසීමට අදාළ කොඩි හෝ දැන්වීම් හෝ ස්ටිකර් හෝ අපේක්ෂකයාගේ අංකය, නම, ඡායාරූප යනාදිය අපේක්ෂකයා ගමන් කරනු ලබන වාහනයේ පමණක් ප්‍රදර්ශනය කිරීම සහ ලියාපදිංචි නොකළ වාහන හෝ ගරාජ් අංක/ව්‍යාජ අංක සහිත වාහන ස්වකීය මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදවා නොගැනීම.

18. අවසරලත් ප්‍රචාරක රැස්වීම් භූමි තුළ මැතිවරණ ප්‍රචාරණය වෙනුවෙන් කරනු ලබන සැරසිලි පරිසරයට හානි නොවන පරිදි සිදු කිරීමටත් ප්‍රචාරක කටයුතු සඳහා පරිසරයට හානිකර ද්‍රව්‍ය භාවිතා කිරීමෙන් වැළකී සිටීමටත් එබඳු රැස්වීම් කටයුතුවලින් පසු අප්‍රමාදව එම සැරසිලි ඉවත් කිරීමටත් ක්‍රියා කිරීම.

19. ඡන්ද විමසීම් කාල සීමාව තුළ මැතිවරණ ප්‍රචාරණ/ප්‍රවර්ධන කටයුතුවලට අදාළව පෙරහැර, මහජන පෙළපාලි හා රථ පෙළපාලි පැවැත්වීම මැතිවරණ නීති උල්ලංඝනය කිරීමක් බැවින් එවැනි මහජන පෙළපාලි, පෙරහැර, රථ පෙළපාලි, බයිසිකල් පෙළපාලි යනාදි කිසිවක් ඡන්ද විමසීම් කාල සීමාව තුළ නොපැවැත්වීම.

20. ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීම සඳහා, නියමිත අවසරය ලබාගෙන පමණක් ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීම, එම ශබ්ද විකාශන කටයුතු රැස්වීම් පැවැත්වෙන කාලයට සහ එම රැස්වීම් භූමියට පමණක් සීමා කිරීම හා ධාවනයේ යෙදෙන වාහනවල සවිකළ ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් ප්‍රචාරක කටයුතු නොකිරීම.

21. මැතිවරණ දින ඡන්ද විමසීම් ඇරඹීමට නියමිත වේලාවට පැය 48 කට පෙරාතුව අදාළ ඡන්ද විමසීම් නීතිය අනුව මැතිවරණ ප්‍රචාරණ කටයුතු නතර කිරීමට පියවර ගැනීම සහ එම නිහඬ කාල සීමාව තුළ දේශපාලන පක්ෂ හෝ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා සංගීත සංදර්ශන වැනි දෑ පැවැත්වීම සහ මුද්‍රිත/විද්‍යුත් ජනමාධ්‍ය හරහා දැන්වීම් ප්‍රකාශයට පත් කිරීම යනාදී කාර්යයන් අත්හිටුවීම.

22. කිසිදු පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් නියෝජනය කරමින් පාර්ලිමේන්තුවේ, පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක මහජන නියෝජිතයෙකු වශයෙන් තනතුරක් දරන අයෙකු, යම් පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ ඒවායේ අපේක්ෂකයින් ජයග්‍රහණය කරවීමට තමාට මහජන නියෝජිතයකු වශයෙන් ලැබී ඇති වරප්‍රසාද, බලතල දරමින්, වාහන හා රාජ්‍ය දේපළ යොදා නොගැනීම හා නිල රාජකාරි කටයුතු හරහා මැතිවරණ ප්‍රචාරක කටයුතු කිරීමෙන් වැළකීම.

23. මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් රජයේ ගුවන්යානා හෝ වෙනත් වාහන නොමිලයේ භාවිතා කිරීමෙන් වැළකීම.

24. යම් මැතිවරණ නීතියක් අනුව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව මඟින් ඡන්ද විමසීමක් සඳහා තරග කරනු ලබන දේශපාලන පක්ෂවලට හා ස්වාධීන කණ්ඩායම්වලට මැතිවරණ නීතිය යටතේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් ලබාදෙන ගුවන් කාල සීමා, අදාළ සංස්ථා ප්‍රධානීන් හා මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන උපදෙස් හා කොන්දේසි අනුව භාවිතා කිරීම (පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වලට අදාළ නොවේ.)

25. යම් මැතිවරණ නීතියක් අනුව ඡන්ද විමසීමක දී ඡන්ද හිමියන් ලියාපදිංචි සෑම ගෘහයක් වෙතම තරග කරනු ලබන දේශපාලන පක්ෂවලට හා ස්වාධීන කණ්ඩායම්වලට සංදේශයක් යැවීමට ඇති අයිතිය, අදාළ පනතේ ප්‍රතිපාදන හා තැපැල්පතිවරයා විසින් නියම කරනු ලබන ආකාරයට භාවිතා කිරීම. (පළාත් සභා හා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වලට අදාළ නොවේ.)

26. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ හෝ උසස් පෙළ විභාග හා 5 වසර ශිෂ්‍යත්ව විභාගය ඇතුළු වෙනත් ප්‍රසිද්ධ විභාග පැවැත්වෙන මෙන්ම එම විභාගවල ඇගයීම් කෙරෙන විදුහල්වලට/විභාග මධ්‍යස්ථානවලට බාධාවන අයුරින් ඒවා අවට ඡන්ද ප්‍රචාරක කටයුතු කිරීමෙන් වැළකී සිටීම.

27. ප්‍රචාරණ කටයුතුවල දී ළමයින්ගේ ඡායාරූප ඇතුළත් පෝස්ටර්, දැන්වීම්, කටවුට් හා වීඩියෝ දර්ශන භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතු අතර, ප්‍රචාරක කටයුතු සඳහා ළමයි සහභාගී කරවා ගැනීමෙන් වැළකිය යුතු ය.

28. ප්‍රසිද්ධ විභාග හා ශිෂ්‍යත්ව විභාගයට අදාළව පවත්වනු ලබන අධ්‍යාපනික සම්මන්ත්‍රණ හරහා පක්ෂ අපේක්ෂක ප්‍රවර්ධනය සිදු නොකිරීම.

29. යම් අපේක්ෂකයෙකු විසින්, වෙනත් පක්ෂයක් හෝ අපේක්ෂකයකු සම්බන්ධව පූර්වයෙන් කරන ලද ප්‍රකාශ හෝ අදහස් දැක්වීම තවත් පක්ෂයක් හෝ අපේක්ෂකයෙකු ප්‍රවර්ධනයට හෝ අගතියට පත් කිරීම සඳහා භාවිතා කිරීම සම්බන්ධයෙන් පූර්වයේ දී එකී ප්‍රකාශ හෝ අදහස් දැක්වීම කරනු ලැබූ තැනැත්තා විරුද්ධත්වය ප්‍රකාශ කරනු ලැබුවහොත් එවැනි ප්‍රකාශ, අදහස් දැක්වීම් යනාදිය භාවිතා කිරීමෙන් වැළකී සිටීම.

30. සමාජ මාධ්‍ය සහ අන්තර්ජාලය මඟින් මැතිවරණ ප්‍රචාරණ කටයුතු සිදු කිරීමේ දී පහත කරුණුවලට අවධානය යොමු කරමින් සමාජ මාධ්‍යයන්ට අදාළ වන ආචාරධර්ම පද්ධතියට අනුකූලව සිදු කිරීම.

i. කෘත්‍රිම බුද්ධිය අනුසාරයෙන් සාදන ලද පරිගණක වැඩසටහන් මඟින් අසත්‍ය පුවත්, දූස්තොරතුරු සහ හිතා මතා වෙනස් කරන ලද හෝ විකෘති කරන ලද හෝ තොරතුරු ප්‍රචාරණයන් සිදු නොකිරීම.
ii. වෙනත් පුද්ගලයන් නමින් අසත්‍ය සමාජ මාධ්‍ය ගිණුම් නිර්මාණය කරමින් අනෙකුත් අපේක්ෂකයන් අගතියට පත් කරන ආකාරයට කටයුතු නොකිරීම.
iii. වෙනත් පක්ෂ/කණ්ඩායම්/අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීම් සිදු කරන පුද්ගලයන්ට අන්තර්ජාලය සහ සමාජ මාධ්‍ය හරහා බිය වැද්දවීම්, හිරිහැර කිරීම් සිදු නොකිරීම.
iv. අසත්‍ය පුවත්, දූස්තොරතුරු සහ හිතා මතා වෙනස් කරන ලද හෝ විකෘති කරන ලද හෝ තොරතුරු ව්‍යාප්තියට සමාජ මාධ්‍ය මෙහෙයුම්කරුවන් යොදා නොගැනීම.
v. අසත්‍ය සමාජ මාධ්‍ය ගිණුම් හරහා වැරදි ජනමතයක් ඇති කරවීමට හෝ හුවා දැක්වීමට උත්සාහ නොකිරීම.
vi. සමාජ මාධ්‍ය ඔස්සේ පූර්ව මැතිවරණ මත විමසීම් සිදු කිරීමට අනුබල නොදීම.
vii. සමාජ මාධ්‍යවල ප්‍රසිද්ධ වී සිටින බලපෑම්කරන්නන් (influencers) මඟින් ප්‍රචාරණ කටයුතු සිදු කිරීමේ දී ඒ සම්බන්ධයෙන් වන ආචාර ධර්ම පද්ධතියට අනුකූල වන ලෙස එය සිදු කිරීම.

ඇ. ඡන්ද විමසීමේ දින

01. ඡන්ද විමසීම් දිනයේ ඡන්ද පොළේ සිට මීටර් 500 ක් ඇතුළත, සීමාව තුළ සිදු කිරීමට තහනම් කර ඇති කිසිදු ක්‍රියාවක්, විශේෂයෙන් ඡන්දය ආයාචනා කිරීම් යනාදී මැතිවරණ නීතියේ සඳහන් වරදවල් සිදු නොකිරීම.

02. ඡන්ද විමසීම සඳහා ඡන්ද පොළට පැමිණෙන හා ඡන්ද පොළේ දී ඡන්දය පාවිච්චි කරන ඡන්දදායකයින්ට කිසිදු බාධාවක් නොකිරීම සහ ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා බලපෑම් කිරීමෙන් වැළකීම සහ ඡන්ද දායකයාට, ඡන්දය ස්වාධීනව නිදහස්ව හා රහස්ව පාවිච්චියට ඇති අයිතියට බාධා නොකිරීම.

03. ඡන්ද විමසීම් දිනයේ දී ඡන්ද හිමියන්, ඡන්ද පොළ නියෝජිතයින්, ඡන්ද අපේක්ෂකයින්, නිරීක්ෂකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් කිසිඳු බිය වැද්දීමකට ලක් කිරීමෙන්, ශාරීරික වධ හිංසාවලට ලක් කිරීමෙන් හෝ ඔවුන්ගේ දේපළවලට හානි කිරීමෙන් වැළකීම සහ ඡන්දය දීමට පැමිණෙන හෝ ඡන්දය දී ආපසු යන ඡන්ද හිමියන් බිය ගැන්වීමෙන් ඔවුනට බාධා කිරීමෙන් හෝ ඡන්ද පොළ නියෝජිතයින් ඡන්ද පොළෙන් පලවා හැරීමෙන් වැළකීම.

04. ඡන්ද විමසීම් දිනයේ දී ඡන්ද පොළට ඇතුළු වීම සඳහා අවසරය ඇති අය පමණක් (තරග කරනු ලබන දේශපාලන පක්ෂයක ලේකම්, අපේක්ෂකයින් හා ඡන්ද පොළ නියෝජිතයින්) ඇතුළු විය යුතු බැවින් ඒ සම්බන්ධයෙන් සහාය දක්වා ක්‍රියා කිරීම හා ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු වීම සහ ඡන්ද පොළ තුළට ආරක්ෂකයින් හෝ මාධ්‍යවේදීන්, ඡායාරූප ශිල්පීන් කැඳවා ගෙන ඒමෙන් වැළකී සිටීම.

05. මැතිවරණ නීතියේ සඳහන් කිසිදු වරදක් හෝ මැතිවරණ දූෂණ ක්‍රියාවක් කිරීමෙන් හා ඊට අනුබල දීමෙන් වැළකීම. (ඡන්ද පොළේ දී ඡන්ද පෙට්ටි බලෙන් පිරවීම, ඡන්ද පොළට කඩා වැදීම හෝ හොර ඡන්ද දැමීම ආදී වැරදි හා දූෂණ ක්‍රියා)

06. නීත්‍යානුකූල නොවන අන්දමින් ඡන්ද පොළ කරා ඡන්දදායකයින් ප්‍රවාහනය නොකිරීමට වග බලා ගැනීම.

07. ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා එම කටයුතු භාරව ක්‍රියාකරන කාර්ය මණ්ඩලයට අපේක්ෂිත ආකාරයට සහාය වීම හා ඔවුනගේ කටයුතුවලට ඡන්ද පොළ නියෝජිතයින් බාධා නොකරන බවට වග බලා ගැනීම.

08. මැතිවරණ කොමිෂන් සභාවේ අවසරය මත ඡන්ද විමසීම් කටයුතු නිරීක්ෂණය කරන නියෝජිතයින්ට, නිරීක්ෂණ සංවිධානවල නියෝජිතයින්ට බාධා නොකිරීම හා ඔවුන්ගේ කාර්යයන් ඉටු කිරීමට සහාය වීම.

09. ඡන්ද පොළ පරිශ්‍රය තුළ ඡායාරූප ගැනීම, ජංගම දුරකථන භාවිතය යනාදී තහනම් ක්‍රියා නොකිරීම සහ ඡන්ද මධ්‍යස්ථානයක් තුළ හෝ තැපැල් ඡන්ද මධ්‍යස්ථානයක් තුළ හෝ ඡායාරූප ගැනීමෙන්, වීඩියෝගත කිරීමෙන් වැළකී සිටිය යුතු ය. යම් හෙයකින් එසේ ඡායාරූප හෝ වීඩියෝ දර්ශන ලබා ගැනීම හෝ වෙනත් අයෙකු විසින් ලබාගත් ඡායාරූප හෝ වීඩියෝ දර්ශන විද්‍යුත්, මුද්‍රිත හෝ සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රසිද්ධියට පත්කිරීම හෝ බෙදාහැරීම හෝ අනුබලදීම නොකළ යුතු ය.

ඉහත සඳහන් කරුණු අදාළ වන විට තැපැල් ඡන්ද සළකුණු කිරීමේ දිනය සඳහා ද වලංගු වන ලෙස සැලකීම යෙහෙකි.

**ඉ. ඡන්ද හා මනාප ගණන් කිරීම (තැපැල් ඡන්ද ඇතුළුව) හා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම**

01. ඡන්ද හා මනාප ගණන් කිරීමේ (තැපැල් ඡන්ද ගණන් කිරීම ද ඇතුළුව) ක්‍රියා පිළිවෙල සම්බන්ධයෙන් ස්වකීය ගණන් කිරීමේ නියෝජිතයන් දැනුවත් කිරීම හා පැමිණිලි ඉදිරිපත් කිරීමේ නිසි ක්‍රමවේදය ගැන ස්වකීය නියෝජිතයන් දැනුවත් කිරීම.

02. ගණන් කිරීමේ ශාලා හා ප්‍රතිඵල සකස් කිරීමේ ස්ථානය තුළ එම කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව, තේරීම්භාර නිලධාරී විසින් පනවා ඇති විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම අත්‍යවශ්‍ය බවට ස්වකීය නියෝජිතයන් දැනුම්වත් කිරීම.

03. ඡන්ද ගණන් කිරීමේ නියෝජිතයන් ලෙස විධිමත්ව පත්කර ඇත්නම් හෝ අපේක්ෂකයෙකු වන්නේ නම් මිස, නිසි අවසරයක් නොමැතිව රජයේ හෝ පළාත් සභා ඇමතිවරු, පාර්ලිමේන්තු හා පළාත් සභා මන්ත්‍රීවරුන් සහ පළාත් පාලන ආයතන සභිකයන් හෝ වෙනත් දේශපාලන බලධාරීන් ගණන් කිරීමේ පරිශ්‍රයට, ශාලාවට ඇතුළු නොවීමට වග බලා ගැනීම.

04. ඡන්ද ගණන් කිරීමේ හෝ ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ ශාලාවල නියෝජිතයන් ලෙස පැමිණෙන කිසිදු දේශපාලනඥයකු විසින් අවි සහිත හෝ රහිත ආරක්ෂකයින් එකී ශාලා තුළට කැඳවා ගෙන ඒමෙන් වැළකී සිටීම හා ගණන් කිරීමේ ශාලා/ ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ ශාලා පරිශ්‍රයට අනවසර පුද්ගලයින් කැඳවාගෙන පැමිණීමෙන් වැළකීම.

**ඊ. වෛරී හෝ ජාතික සමගියට හෝ එරෙහි ප්‍රකාශ සහ අසත්‍ය පුවත් නිකුත් කිරීම**

පහත පරිදි වෛරී හෝ ජාතික සමගියට හෝ එරෙහි ප්‍රකාශ සහ අසත්‍ය පුවත් මුද්‍රිත විද්‍යුත් ජනමාධ්‍ය හෝ සමාජ මාධ්‍ය මඟින් හෝ නිකුත් කිරීම, එම ප්‍රකාශයන්ට අනුබල දැක්වෙන ආකාරයේ ප්‍රතික්‍රියා දැක්වීමෙන් වැළකීම සිදුකළ යුතු ය.

01. කාන්තාවන්, විශේෂ අවශ්‍යතා ඇති නැතහොත් ආබාධිත පුද්ගලයින් වෙනස් වූ ලිංගික හැඩගැසීම් සහිත පුද්ගලයින් සහ වෙනත් ආගමික හෝ ජනවාර්ගික කණ්ඩායම් විශේෂ කොට එවැනි ප්‍රජා හෝ සමාජ කණ්ඩායම් බිය ගන්වන හෝ අපහාසයට ලක්කරන කවර හෝ ආකාරයේ වෛරී ප්‍රකාශ සිදු කිරීමෙන් වැළකිය යුතු ය.

02. දේශපාලනමය කටයුතුවල නිරතවන සියලුම තැනැත්තන් වෛරී ප්‍රකාශ සිදු කිරීමෙන් සියලු කල්හි වැළකී සිටිය යුතු ය. එතකුදු වුවත්, විශේෂයෙන් කවර හෝ ඡන්ද විමසීමක නාමයෝජනා කාලපරිච්ඡේදය ආරම්භ වන පළමු දින සිට එම ඡන්ද විමසීම පවත්වන දිනට පසු දිනෙන් අවසන් වන කාල පරිච්ඡේදය තුළ එසේ කිරීමෙන් වැළකී සිටිය යුතුම ය.

03. වෛරී ප්‍රකාශ වරදක් වශයෙන් හඳුනාගනු ලැබ ඇති බැවින් එවැනි ප්‍රකාශ කරනු ලබන තැනැත්තන් පිළිබඳව වාර්තා කරනු ලැබිය යුතු ය.

04. ජනවාර්ගික හා ආගමික කණ්ඩායම් අතර සුහදත්වය හා අන්‍යෝන්‍ය විශ්වාසය පළුදු වන ආකාරයේ කවර හෝ ප්‍රකාශ සිදු කිරීමෙන් හෝ කවර හෝ රූප ප්‍රදර්ශනය කිරීමෙන් වැළකිය යුතු ය.

05. ජනවාර්ගික හෝ ආගමික කණ්ඩායම්වල සහ පුද්ගලයන්ගේ අභිමානය පළුදු වන හෝ ඊට හානිකර කවර හෝ ප්‍රකාශ සිදු කිරීමෙන් වැළකිය යුතු අතර, එවැනි ප්‍රකාශ ප්‍රචාරණ කටයුතු සඳහා භාවිතා කිරීමෙන් වැළකිය යුතු ය.

06. ආගමික, ජනවාර්ගික, භාෂාමය, කුල හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාව පිළිබඳ වෙනස්කම් පාදක කර ගනිමින් කවර හෝ තැනැත්තකුට හෝ කණ්ඩායමකට අගතිදායක හෝ වෙනස්කොට සළකනු ලබන බවට සැළකිය හැකි කවර හෝ ප්‍රකාශ සිදු කිරීමෙන් හෝ කවර හෝ ක්‍රියාවන් සිදු කිරීමෙන් වැළකිය යුතු ය.

07. කාන්තාවකගේ ශරීර අවයව පදනම් කරගනිමින් කාන්තාවන්ට අවමන් සහගත හෝ අපවාදත්මක කවර හෝ ප්‍රකාශයක් කිරීමෙන් හෝ කවර හෝ ක්‍රියාවන් කිරීමෙන් වැළකිය යුතු ය. මෙම කරුණ කාන්තාවන් සම්බන්ධයෙන් විශේෂකොට දක්වා ඇත්තේ වුවද සියලුම පුරවැසියන්ට ද අදාළ වන බැවින් එවැනි කරුණුවලින් වැළකී සිටිය යුතු ය.

08. කවර හෝ පුද්ගලයෙකුගේ යම් ආකාර අංගවිකලත්වයක් හෝ ආබාධිත බවක් පිළිබඳව අවමන් සහගත හෝ අපවාදත්මක කවර හෝ ප්‍රකාශයක් කිරීමෙන් හෝ කවර හෝ ක්‍රියාවක් සිදු කිරීමෙන් වැළකිය යුතු ය.

09. මැතිවරණ සමය තුළ විරුද්ධ පාර්ශ්වවලට හා ඒවායේ ක්‍රියාකාරීන්ට මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මගින් සනාථ කළ නොහැකි හෝ වැරදි චෝදනා ඉදිරිපත් කරමින් හා අදාළ පාර්ශ්වයන්ට එබඳු අවස්ථාවලදී පිළිතුරු දීමට පවා අවකාශ ලබා නොදී ඉදිරිපත් කරන වැඩසටහන් ප්‍රචාරණය කිරීමට මාධ්‍ය යොදා ගැනීමෙන් වැළකී සිටීම.

10. දේශපාලන පක්ෂයක් හෝ දේශපාලනඥයන් සම්බන්ධයෙන් කරනු ලබන විවේචන හා චෝදනාවලට ප්‍රතිචාර දැක්වීමේ දී කවර හෝ ආකාරයේ මැතිවරණ ප්‍රචාරයන්ගෙන් (විශ්වාස කටයුතු නොවන මැතිවරණ ප්‍රවර්ධන තොරතුරු ප්‍රචාරය කිරීමෙන්) වැළකී ප්‍රචණ්ඩකාරී නොවන නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයෙන් පමණක් පිළිතුරු සැපයීම.

උ. සංග්‍රහ කිරීමෙන් වැළකීම

01. ඡන්ද විමසීම් කාලසීමාව තුළ ඡන්ද හිමියන් හෝ රජයේ නිලධාරීන් හෝ තනිවම හෝ සමූහ වශයෙන් හෝ ස්වකීය පෞද්ගලික හෝ නිල කාර්යාල වෙත හෝ නිවාසවලට කැඳවා සංග්‍රහ කිරීමෙන් වැළකීම.

02. කිසියම් අකාරයෙන් මූල්‍ය ප්‍රදානය කිරීම හෝ පොරොන්දු දීම්, ව්‍යාපෘති හෝ යෝජනා සඳහා මුල්ගල් තැබීම්, මාර්ග, ජල හා විදුලි ආදිය පහසුකම් සැපයීම සඳහා පොරොන්දු දීම හා තම පක්ෂයට වාසිවන ආකාරයට නම්මවාගත හැකි ඡන්දදායකයින් වෙනුවෙන් ක්‍රමානුකූල නොවන ආකාරයට හදිසියේ රාජ්‍ය අංශයේ තනතුරු හා පත්වීම් ප්‍රදානය කිරීමෙන් වැළකීම.

03. දේශපාලන නැඹුරුවක් සහිත පත්වීම් ලබාදීම, උසස්වීම් සහ ස්ථානමාරු කිරීම සඳහා සෘජු හෝ වක්‍ර දායකත්වයක් සැපයීමෙන් වැළකීම.

උ. ජාතිය, ආගම, ජාතික සංකේත හා ආගමික සංකේත භාවිතය හා වෙනත් විශේෂ කරුණු

01. ජාතික ගීය, ජාතික ධජය, ආගමික සංකේත, ආගමික ධජ, ආගමික ශාස්තෘවරුන්ගේ හෝ ආගමික නායකයින්ගේ සිතුවම් හෝ ඡායාරූප යනාදිය පළ කිරීම නැතහොත් ප්‍රචාරය කිරීම හරහා කිසිම දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙකු ප්‍රවර්ධනය කිරීමට හෝ අගතියට පත් කිරීම සඳහා යොදා නොගත යුතු ය. තවද, ඒවා පක්ෂ/ කණ්ඩායම් හෝ අපේක්ෂක ප්‍රවර්ධන රැළි, රැස්වීම් යනාදියෙහි දී හෝ දැන්වීම්, ප්‍රචාරක පුවරු යනාදියෙහි ප්‍රදර්ශනය නොකළ යුතු ය. තව ද, පක්ෂ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා කිසිදු රාජ්‍ය නිලධරයකු ඡායාරූප හෝ සිතුවම් කුමන ආකාරයකින් හෝ භාවිතා නොකළ යුතු ය.

02. කවර හෝ ආගමික රැස්වීමක දී යම් ඡන්ද විමසීමක/ මැතිවරණයක ප්‍රතිඵලයට බලපෑමක් සිදු කිරීම පිණිස හෝ එම ඡන්ද විමසීමේ දී මැතිවරණයේ දී කවර හෝ පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක යම් අපේක්ෂකයකුට ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට ඡන්ද හිමියකු පොළඹවන ආකාරයේ කවර හෝ ප්‍රකාශයක් සිදු නොකළ යුතු ය.

03. යම් ඡන්ද විමසීමක දී හෝ මැතිවරණයක දී කවර හෝ පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක අපේක්ෂකයකු තෝරා පත්කර ගැනීම හෝ ඔහුගේ මැතිවරණ ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම පිණිස කුමන හෝ ආගමික සිද්ධස්ථානයක දී යම් අත් පත්‍රිකා, පුවරු, පෝස්ටර්, චිත්‍ර, දැන්වීම්, අපේක්ෂකයාගේ ඡායාරූප, සළකුණු, සංඥා, කොඩි හෝ බැනර් බෙදාහැරීම හෝ ප්‍රදර්ශනය කිරීම හෝ කවර හෝ මහජන රැස්වීම් පැවැත්වීම නොකළ යුතු යි.

ඕනෑම මැතිවරණයක දී/ඡන්ද විමසීමක දී ඉදිරිපත්වන අපේක්ෂකයන් හා අදාළ වන විට ඔවුන් නියෝජනය කරන දේශපාලන පක්ෂ ලේකම්වරුන්, අපේක්ෂකයින්ගේ නියෝජිතයින් හා ආධාරකරුවන් ඉහත සඳහන් කරුණුවලට අනුකූලව ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, මෙම ආචාර ධර්ම පද්ධතියේ ඇතුළත් දෑ ස්වකීය නියෝජිතයින්, පාක්ෂිකයින් හා ආධාරකරුවන් අනුගමනය කරනු ලබන බවට සෑහීමකට පත්විය හැකි ආකාරයේ යාන්ත්‍රණයක් අපේක්ෂකයන් හා අදාළ වන විට පක්ෂ ලේකම්වරුන් ක්‍රියාත්මක කරනු ඇතැයි වැඩිදුරටත් අපේක්ෂා කෙරේ.

EOG 08 - 0341